*සැ. යු.*– 2007.04.20 වැනි දින පළවූ අංක 1,494 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොකරන ලදී.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය


**අංක 1,495— 2007 අප්‍රේල් 27 වැනි සිකුරාදා — 2007.04.27**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන ම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | — | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 345 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

*ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන ගැසට් නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මින් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට් නිවේදන* භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12ට අවසන් කරනු ලැබේ. තනතුරු –ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම් පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙනසේ සකස් කරන මෙන් සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මින් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර–එනම් 2007 මැයි මස 04 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යායුතු දැන්වීම් 2007 අප්‍රේල් මස 20 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුයි.

**ලක්ෂමන් ගුණවර්ධන**,
ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

2007 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධි විධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසකට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුද්දකට හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම් කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයා පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුර හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදී වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටත් වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ටද, ඔහුගේ සහාකාරයින්ටද, අනිකුත් විභාගාපේක්ෂකයින්ටද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවූවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභගශාලාධිපතිගේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දී විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරීම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියක් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩ ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කිසිම දෙයක් ඉන් පිටත ගෙනයෑම තහනම්ය. එකම ප්‍රශ්නයකට පිළිතුරු දෙතැනක ලියැවී තිබේ නම් අනවශ්‍ය පිළිතුරු පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. මේ කරුණු පැහැර හැරීම වංචාවක් කිරීමට ප්‍රයත්න දැරීමක් සේ සැළකීමට ඉඩ තිබේ.

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදී උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු වනවා ඇත.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හෝ කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හෝ ජ්‍යාමිතික උපකරණ පෙට්ටි අවශ්‍ය අවස්ථාවලදී ඒවා හැර අන්‍ය අත් බෑග්, පසුම්බි පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැමූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් ජේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත හෝ තමා සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම්ය. විභගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටී. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්න දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ පත්‍රයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවිම හෙවත් කොපි කිරීම හොර උත්තර ලිවීමටද යත්න දැරීම තහනම්ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම් කරුවෙකුට උදව්දීමෙන්ද, වෙන අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබාගැනීමෙන්ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු ලියන විට හෝ විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල්ය. විභාගාපේක්ෂකයින් එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසියම් අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය :

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන පමණ කළින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටත් පිරිසෙයින් විනාඩි 10 කට හෝ 15 කට කළින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇතිවූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගාපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්ට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුගණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කූඩු, මකන, රේදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තමන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිවද පිරිසිදුවද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තැබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහාය. දකුණු පැත්තේ තීරය වෙන් කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්නද, තෝරා ගත යුතු අන් ප්‍රශ්නද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් කියවා බැලිය යුතුයි. මෙය නොසලකා හැරීමෙන් බොහෝ විට පාඩු සිදුවිය හැකිය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන්වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරිදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකිරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවූවකු සේ සළකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියුන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතීන්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## උපතැපැල් ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීමේ තරග විභාගය 2007

ශ්‍රී ලංකා උපතැපැල් ස්ථානාධිපති සේවාවේ උපතැපැල් ස්ථානාධිපති තනතුර සඳහා ඉල්ලුම් පත් භාරගනු ලැබේ.

01. 2007.05.22 දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි ලාංකිකයින්ට මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

02. *අධ්‍යාපන සුදුසුකම්* :

(අ) භාෂාව හෝ සාහිත්‍යය සහ අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය ඇතුළුව යටත් පිරිසෙයින් සම්මාන 04ක් (හතර) සහිතව ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ

(ආ) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව හෝ සිංහල/දෙමළ/ඉංග්‍රීසි සාහිත්‍යය සහ අංක ගණිතය/ශුද්ධ ගණිතය/මූලික ගණිතය/වාණිජ අංක ගණිතය/ගණිතය යන විෂයයන් ද ඇතුළුව යටත් පිරිසෙයින් විෂයයන් 04ක් (හතර) සඳහා සම්මාන සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06කින් (හය) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ

(ඇ) පළමු භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් හතරකින් (04) “ඒ” හෝ “බී” ශ්‍රේණියේ සාමාර්ථ සහ ඉතිරි විෂයයන් සඳහා “සී” ශ්‍රේණියේ සාමාර්ථ සහිතව දෙවරකට නොවැඩි වාර ගණනක දී විෂයයන් 06 (හය) කින් ජාතික පොදු අධ්‍යයන සහතික පත්‍ර විභාගයෙන් හෝ සමත් විය යුතුය.

*සටහන.*–ගණිතය සහ භාෂාව ඇතුළු විෂයයන් හයකින් (06) සාමාර්ථය සහිත අධ්‍යාපන සුදුසුකම් සපුරා ඇති 1996.01.01 දිනට වැඩ බැලීමේ තනතුරක් දරන උපතැපැල් ස්ථානාධිපතිවරුන්ට මෙම තනතුරට අයදුම් කිරීමට හිමිකම් ඇත.

03. *පදිංචිය පිළිබඳ සුදුසුකම්* :

(අ) *ලිපි බෙදන කාර්යාල* :

අයදුම්කරුවන් දැනට පවතින ලිපි බෙදීම් කරනු ලබන උපතැපැල් කාර්යාලයක් සඳහා එම කාර්යාලයෙන් ලිපි බෙදන සීමාව තුළ, අයදුම්පත් කැඳවන අවසාන දිනට අඩුම වශයෙන් අවුරුදු පහක් (05) පහක් පදිංචිය තිබිය යුතු අයෙකු විය යුතුය.

(ආ) *ලිපි නොබෙදන කාර්යාල* :

ලිපි නොබෙදන උපතැපැල් කාර්යාලයක් සම්බන්ධයෙන් නම් එම උපතැපැල් කාර්යාලය පිහිටි/පිහිටුවන ග්‍රාම සේවා වසම/වසම් තුළ හෝ එම උපතැපැල් කාර්යාලයෙන් සේවය සැලසෙන, ඊට යාබදව පිහිටි ග්‍රාමසේවා වසම තුළ අයදුම්පත් කැඳවන අවසන් දිනට අඩු තරමින් වසර පහක අඛණ්ඩ පදිංචිය ඇති බවට සාධක ඉදිරිපත් කළ යුතුය.

(ඇ) නගර සභා සහ මහ නගර සභා ප්‍රදේශ සම්බන්ධයෙන් නම් අයදුම්කරු අදාළ නගර සභා/මහ නගර සභා සීමාව තුළ වසර පහක (05) අයදුම්පත් කැඳවන අවසාන දිනට පදිංචි ඇති අයෙකු විය යුතුය.

(ඈ) නව ගොවි ජනපද, නව ජනාවාස, නව නිවාස යෝජනා ක්‍රම, නව කාර්මික ජනපද වැනි ස්ථානයන්හි උප තැපැල් කාර්යාලයක් සඳහා ස්ථිර පදිංචි කාලසීමාව පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් නියම කරනු ලැබිය හැක.

04. *වැටුප් හා දීමනා* :

උපතැපැල් ස්ථානාධිපති සේවාවට අදාළ වැටුප් ක්‍රමය පහත දැක්වේ :

MN 1-2006-10 වන පියවර සිට
රු. 14,000 - 120 x 11 - 140 x 19 - 16,760
(රු. 14,720 වැටුප් පියවරට පෙර කාර්යක්ෂමතා කඩඉමකි.)

මීට අමතරව රජය විසින් රාජ්‍ය සේවකයින් සඳහා දෙනු ලබන වෙනත් දීමනා ද, කාර්යාල ඉඩකඩ දීමනාවක් ද තනතුර සඳහා හිමිය. මෙයට අමතරව කාර්යාලයේ කෙරෙන ගණුදෙනු අනුව පෝස්ට්මාස්ටර් ජනරාල් විසින් තීරණය කරනු ලබන ඒකක දීමනාවක් ද ගෙවනු ලබන අතර, ස්ථිර සේවයේ සිටින උපතැපැල් ස්ථානාධිපතීන්ට නිවාඩු දීමනා සඳහා හිමිකම් ලැබේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය* :

(i) පුරප්පාඩු පවතින උපතැපැල් කාර්යාල පිළිබඳ *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* පළකරනු ලබන දැන්වීමකින් ඉල්ලුම්පත් කැඳවා ඒ අනුව ඉල්ලුම්පත් ඉදිරිපත් කරනු ලබන අයදුම්කරුවන් වෙනුවෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන විවෘත තරග විභාගයක ප්‍රතිඵල අනුව බඳවා ගැනීම කරනු ලැබේ.

(ii) අපේක්ෂකයින් විභාගයට සිංහල, දෙමළ හෝ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් එක් භාෂා මාධ්‍යයකින් පෙනී සිටිය යුතුය.

06. *විභාග පරිපාටිය* :

(i) සියලුම අපේක්ෂකයින්, භාෂා හැකියාව සහ අභියෝග්‍යතා පරීක්ෂණය යන විෂයයන් දෙකෙන් සකස් කරන ප්‍රශ්න පත්‍ර දෙකකින් යුතු වූ ලිඛිත පරීක්ෂණයකට පෙනී සිටිය යුතුය. විභාගයේ දී අනන්‍යතාව සනාථ කිරීම සඳහා ජාතික හැඳුනුම්පත හෝ විදේශ ගමන් බලපත්‍රය හෝ පමණක් පිළිගැනේ.

(ii) විෂය නිර්දේශය :

(01) *භාෂා හැකියාව* :

අපේක්ෂකයින්ගේ අදහස් ප්‍රකාශනය, අවබෝධය, අක්ෂර වින්‍යාසය, සහ සරල ව්‍යාකරණ භාවිතය පිළිබඳ දැනුම පරීක්ෂා කෙරෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් යුත් පැය 1 1/2 ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100 යි.)

*සටහන.*–අයදුම්කරුවන්ගේ අත් අකුරු පිළිබඳව සැලකිල්ලක් දක්වනු ලැබේ.

(02) *අභියෝග්‍යතාව* :

සංඛ්‍යාමය හැකියාවන්, තර්කන ශක්තිය, සාමාන්‍ය බුද්ධිය මැනෙන අයුරින් සැකසෙන විෂයානුබද්ධ ප්‍රශ්නවලින් යුතු පැය 01ක ප්‍රශ්න පත්‍රයකි. (ලකුණු 100 යි).

(iii) උපතැපැල් ස්ථානාධිපති සේවාවේ ඇබෑර්තුවලට පත්කිරීම සඳහා සෑම අපේක්ෂකයෙකු විසින්ම මෙම විෂයයන් දෙකෙන් එක් එක් විෂයයට වෙන් කර ඇති ලකුණුවලින් අවම වශයෙන් ලකුණු 40 බැගින්වත් ලබාගත යුතුය.

(iv) 1996.01.01 දින හෝ ඊට පෙර සේවයේ යොදවනු ලැබූ වැඩබලන උපතැපැල් ස්ථානාධිපතිවරුන්ට තරග විභාගයේ දී ලබාගන්නා ලකුණු

ප්‍රමාණයට අමතරව ඒ මත පහත සඳහන් ලකුණු ප්‍රමාණය ලබාගැනීමට හිමිකම් ලැබේ :

| | |
|---|---|
| වසර 01 සිට 02 දක්වා වැඩබලන සේවා කාලය සඳහා | - 10% |
| වසර 02 සිට 03 දක්වා වැඩබලන සේවා කාලය සඳහා | - 15% |
| වසර 03 හා ඊට වැඩි වැඩබලන සේවා කාලය සඳහා | - 25% |

(v) *සම්මුඛ පරීක්ෂණය* :

විභාග කොමසාරිස් ජනරාල් විසින් පවත්වනු ලබන ඉහත සඳහන් තරඟ විභාගයේ දී අපේක්ෂකයින් දක්වන කුසලතාව මත ඇබෑර්තුව පවතින උපතැපැල් කාර්යාල සඳහා තරග කරන විභාග අපේක්ෂකයින් අතරින් උපරිම ලකුණු ලබාගත් අපේක්ෂකයින් පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

සම්මුඛ පරීක්ෂණයේ දී අපේක්ෂකයින්ගේ සහතික පත්‍ර, පදිංචිය පිළිබඳ සුදුසුකම් පමණක් පරීක්ෂා කරනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා ලකුණු දෙනු නොලැබේ.

(vi) මෙම විභාගය පහත සඳහන් නගරවල දී පවත්වනු ඇත. අයදුම්කරුවන් තමන් පදිංචි ලිපිනයට ආසන්නතම නගරය තම විභාග මධ්‍යස්ථානය ලෙස තෝරා ගත යුතුය. අපේක්ෂකයින් ප්‍රමාණවත් සංඛ්‍යාවක් ඉදිරිපත් නොවන විභාග මධ්‍යස්ථාන වෙතොත් ඒවා අවලංගු කිරීමට ඉඩ ඇත :

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 1 |
| මහනුවර | 2 |
| ගාල්ල | 3 |
| රත්නපුරය | 4 |
| බදුල්ල | 5 |
| අනුරාධපුරය | 6 |
| මඩකලපුව | 7 |
| යාපනය | 8 |

07. *බඳවා ගැනීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය. පත්වීම ලැබූ දින සිට වසර 03ක පරිවාස කාලයකට යටත් වේ. වෛකල්පිත විශ්‍රාම ගැනීමේ වයස් සීමාව අවුරුදු 55ක් වන අතර, අනිවාර්ය විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 60ක් වේ. ආයතන සංග්‍රහයේ විධිවිධාන ප්‍රකාර අවුරුදු 57න් ඔබ්බට සේවා කාලය වාර්ෂිකව අවුරුදු 60 දක්වා දීර්ඝ කරනු ලැබිය හැක.

(ii) උපතැපැල් ස්ථානාධිපති සේවාවේ ස්ථාන මාරුවීම් අදාළ දිස්ත්‍රික්කය තුළ පමණක් කළ හැකිය.

(iii) තෝරාගනු ලබන අපේක්ෂකයින් රු. 7,500ක ඇප මුදලක් තැන්පත් කළ යුතුය. කාර්යාලය භාර ගැනීමට පෙර මේ මුදලින් හරි අඩක් තැන්පත් කළ යුතු අතර, ඉතිරි කොටස උපතැපැල් ස්ථානාධිපතිගේ වැටුපෙන් මාසික වාරික මගින් අයකර ගනු ලැබේ.

(iv) පෝස්ට්මාස්ටර් ජනරාල් හෝ ඔහුගේ නියෝජිතයා හෝ උපතැපැල් කාර්යාලය පිහිටුවීම සඳහා සුදුසුයැයි නියම කරන මධ්‍යස්ථානයක ප්‍රමාණවත් ඉඩකඩ සහිත ගොඩනැගිල්ලක් තෝරා පත්වන අයදුම්කරු විසින් සැපයිය යුතුය. තෝරා පත්කර ගත් උපතැපැල් ස්ථානාධිපතිට පෝස්ට්මාස්ටර් ජනරාල්ගෙන් හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකුගෙන් මාස 03කට නොඅඩු කාලසීමාවක දැන්වීමක් ලැබුණු වහාම උපතැපැල් කාර්යාලය පිහිටි ස්ථානය වෙනස් කිරීමට බැඳී සිටී.

(v) නිවාඩු ලබාගන්නා අවස්ථාවන්හි දී තම වියදමින් ආදේශකයෙකු සේවයේ යෙදවීම උපතැපැල් ස්ථානාධිපතිවරයාගේ වගකීම වේ.

(vi) තෝරාගනු ලබන අයදුම්කරුවන් යෝග්‍ය ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුතු විය යුතු අතර, මේ සඳහා රජයේ වෛද්‍ය පරීක්ෂණයකින් සමත්වීම අවශ්‍ය වේ.

(vii) තෝරාගනු ලබන අයදුම්කරුවන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වැනි පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම පිණිස දැනට පවත්නා වූ සහ මින්මතු පනවනු ලබන්නා වූ නීතිරීති සහ ව්‍යවස්ථාවන්ට අනුකූලව ක්‍රියාකළ යුතුය.

08. *විභාගයට ඉල්ලුම් කිරීමේ ක්‍රමය* :

(i) මෙම නිවේදනය අවසානයේ දක්වා ඇති ආදර්ශ ආකෘතිය අනුව අංක 01 සිට 07 දක්වා ඡේදයන් පළමුවන පිටුවට ඇතුළත් වන පරිදි "ඒ 4" ප්‍රමාණයේ කඩදාසිවල අයදුම්පත් පිළියෙල කළ යුතුය. සම්පූර්ණ කරන ලද ඉල්ලුම් පත් අදාළ ප්‍රාදේශීය තැපැල් අධිකාරී වෙත 2007.05.22 වැනි දිනට හෝ ඊට ප්‍රථම ඉදිරිපත් කල යුතුය. නියමිත පෝර්මයෙන් තොර වූ ඉල්ලුම් පත්‍ර හා ඉල්ලුම් පත්‍ර භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන ඉල්ලුම්පත්‍ර ද ප්‍රතික්ෂේප කරනු ලැබේ.

(ii) දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු විසින් සහතික කළ යුතුය. අනෙකුත් අයදුම්කරුවන්ගේ අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ පාසලක විදුහල්පතිවරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, මාණ්ඩලික ශ්‍රේණියේ තනතුරක් දරන නිලධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපතිනමක්, වෙනත් ආගමික ප්‍රධානියකු හෝ වගකිව යුතු තැනක් දරන වෙනත් ඕනෑම ආගමික නායකයෙකු විසින් සහතික කළ යුතුය.

(iii) "ඉල්ලුම් පත්‍රයේ ශීර්ෂයේ (හෙඩිමේ) සඳහන් විභාගයේ නම අදාළ පරිදි සිංහල/දෙමළ භාෂාවන්ට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද යොදන්න".

09. *විභාග ගාස්තු* :

විභාග ගාස්තුව රු. 200 කි. මෙම මුදල ළඟම ඇති තැපැල් කාර්යාලයකට ගෙවා ලබාගන්නා ලද කුවිතාන්සිය ඉල්ලුම් පත්‍රයේ අදාළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. කුමන කරුණක් නිසාවත් විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව හෝ ඉන් කොටසක් හෝ ආපසු ගෙවනු නොලැබේ. අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

10. (i) සෑම අපේක්ෂකයෙකුම තමන් ඉල්ලුම් කළ භාෂා මාධ්‍යයෙන් පමණක් විභාගයට පෙනී සිටිය යුතුය. කුමන කරුණක් නිසාවත් භාෂා මාධ්‍යය වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ.

(ii) අපේක්ෂකයින් විසින් තම තමන්ට නියම කරනු ලබන විභාග ශාලාවේහිදීම විභාගයට පෙනී සිටිය යුතුය. සියලුම විභාග අපේක්ෂකයින් රජයේ විභාග සම්බන්ධයෙන් බලපාන පොදු ව්‍යවස්ථාවන් පිළිපැදීමට බැඳී සිටී.

11. කිසියම් ඉල්ලුම්කරුවෙකු කෙළින්ම හෝ අනියම් ලෙස හෝ තමන් තෝරාගනු පිණිස දෙපාර්තමේන්තුවේ කිසියම් නිලධාරියෙකු නම්මා ගැනීමට උත්සාහ කළහොත් එම ඉල්ලුම්කරුවා නුසුදුස්සකු බවට පත් වේ.

12. තනතුර සඳහා තමන් තෝරා ගතහොත් කාර්යාලය පවත්වාගෙන යාමට බලාපොරොත්තු වන ගොඩනැගිල්ලේ පිහිටීම දැක්වෙන ප්‍රදේශයේ කටු සිතියමක් ඉල්ලුම්කරුවන් විසින් අයදුම්පතට අමුණා එවිය යුතුයි.

13. සියලුම ඉල්ලුම් පත්‍ර ලැබුණු බව දන්වනු ලැබේ. ඉල්ලුම් පත්‍ර භාරගැනීමේ අවසාන දින සිට දින 07ක් ඇතුළත ඉල්ලුම් පත්‍රය ලැබුණු බවට දැන්වීමක්

නොලැබුණු යම් ඉල්ලුම්කරුවෙකු වෙතොත් ඒ බව අදාළ ප්‍රාදේශීය තැපැල් අධිකාරි, වෙත වහාම දැන්විය යුතුය. ඉල්ලුම් පත්‍ර ප්‍රාදේශීය තැපැල් අධිකාරි කාර්යාලයේ ප්‍රාදේශීය තැපැල් අධිකාරි......... යන ලිපිනයට එවිය යුතුය. ඒවා පුද්ගලික නමට නොඑවිය යුතුය.

14. යම් අයදුම්කරුවෙකුගේ ඉල්ලුම් පත්‍රයෙහි යම්කිසි අසත්‍ය තොරතුරු සඳහන් කොට තිබෙන බැව් ඔහු/ඇය තෝරා ගැනීමට කලින් දැනගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන්ම තනතුරට නුසුදුස්සෙකු බවට පත්කරනු ලැබීමටත්, තෝරා ගැනීමෙන් පසුව ඒ බව අනාවරණය වුණි නම්, සේවයෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

15. මේ නිවේදනයේ හා ඉල්ලුම් පත්‍රයේ සඳහන් අවශ්‍යතාවන් සියල්ලම සෑම ආකාරයෙන්ම සම්පූර්ණ නොකෙරෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලබන්නේ ය.

කේ. ඒ. එස්. සේනාධීර,
පෝස්ට් මාස්ටර් ජනරාල්.

2007 අප්‍රේල් මස 11 වැනි දින,
තැපැල් මූලස්ථානය,
අංක 310, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 01000.

(කාර්යාලීය ප්‍රයෝජනය සඳහා)

උපතැපැල් ස්ථානාධිපතිවරුන් බඳවා ගැනීමේ තරග විභාගය සඳහා
ඉල්ලුම්පත්‍රය - 2007

**Competitive Examination for recruitment of Sub Postmasters - 2007**

ශීර්ෂ අංක 07 තෙක් මුල් පිටුවට ගෙන ඉල්ලුම්පත්‍රය සකස් කරන්න.

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

01. විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන මධ්‍යස්ථානය :———.
මධ්‍යස්ථාන අංකය
(ගැසට් නිවේදනයේ 06 (vi) ට අනුව)

02. i. මුලකුරු සමග නම (ඉංග්‍රීසියෙන්) :————.
(උදා SILVA, A.B.)
ii. මුලකුරුවලින් හැඳින්වෙන නම්
(සිංහලෙන්) :————.
(ඉංග්‍රීසියෙන්) :————.

03. i. ස්ථිර ලිපිනය :————.
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට එවනු ලැබේ.)
ii. දෙපාර්තමේන්තුවක සේවයේ යෙදී සිටී නම්, කාර්යාලයීය ලිපිනය :

04. i. පුරප්පාඩුව පවත්නා උපතැපැල් කාර්යාලය :————.
ii. උපතැපැල් කාර්යාලයේ අංකය (දැන්වීමේ සඳහන් පරිදි) :

05. i. ස්ත්‍රී/පුරුෂ භාවය: ස්ත්‍රී 1 පුරුෂ 0
(අදාළ අංකය කොටුව තුළ ලියන්න)
ii. උපන් දිනය : අවුරුද්ද :———. මාසය :———.දිනය :———.
iii. ඉල්ලුම්පත් කැඳවීමේ අවසාන දිනයට වයස (2007.05.22 දිනට) :

අවුරුදු : මාස : දින :

06. ඔබ ශ්‍රී ලාංකිකයකු වූයේ උත්පත්තියෙන් ද? ලියාපදිංචි වීමෙන් ද?
:————.

07. i. උපතැපැල් ස්ථානාධිපති පුරප්පාඩුව පවත්නා ප්‍රදේශයේ අඛණ්ඩව අවුරුදු පහක හෝ ඊට වැඩි කාලයක ස්ථිර පදිංචියක් ඔබට තිබේ ද? :———.
ii. ඔබ පදිංචි ග්‍රාම නිලධාරි වසම හා එහි අංකය :———. අංකය
iii. කොපමණ කාලයක සිට ඔබ එහි පදිංචිව සිටී ද? :————.
iv. ඔබ පදිංචි නිවසට ලිපි බෙදන තැපැල් කාර්යාලයේ නම :———.
v. ගොවි ජනපදයක පිහිටි හෝ පිහිටුවන උපතැපැල් කාර්යාලයක් සඳහා නම්, එම ජනපදයේ ඔබ පදිංචියට පැමිණි දිනය :————.
vi. ජනපද ඉඩමේ අයිතිකරු ඔබ නොවේ නම්, ජනපදිකයාට ඇති ඔබේ සම්බන්ධය :————.

08. i. නිවේදනයේ 6-(iv) ඡේදය යටතේ ඔබ අනුග්‍රහ ලකුණුවලට හිමිකම් ලබා තිබේ ද ? :————.
ii. එසේ නම් ඒ පිළිබඳ විස්තර :————.

09. *අධ්‍යාපන සුදුසුකම් :*

i. සමත් වූ විභාගයේ නම :———. සමත්වූ විභාගයේ නම :———.
විභාගය පැවැත්වූ වර්ෂය හා මාසය :———. විභාගය පැවැත්වූ වර්ෂය හා මාසය :———.
විභාග අංකය :———. විභාග අංකය :———.
විභාග මධ්‍යස්ථානය :———. විභාග මධ්‍යස්ථානය :———.
අංකය :———. අංකය

| *සමත්වූ විෂයයන්* | *ලැබූ සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

| *සමත්වූ විෂයයන්* | *ලැබූ සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |
| 5. | |
| 6. | |
| 7. | |
| 8. | |
| 9. | |
| 10. | |

ii. වෙනත් අධ්‍යාපන සුදුසුකම් :

10. උපතැපැල් කාර්යාලය දැනට පිහිටි ස්ථානයට හෝ යෝජිත ස්ථානයට හෝ යාර 200ක් ඇතුළත උපතැපැල් කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සුදුසු ගොඩනැගිල්ලක් ඔබට සොයා ගත හැකි ද? පිහිටීම කෙටියෙන් විස්තර කොට කටු සැළැස්මක් යා කරන්න :————.

11. ඔබ නිවාඩු ලබා ගන්නා අවස්ථාවක ඔබ වෙනුවෙන් රාජකාරි කිරීම සඳහා ආදේශකයෙකු වශයෙන් ලියාපදිංචි කිරීමට (උපතැපැල් ස්ථානාධිපතිවරයෙකු සඳහා තිබිය යුතු සුදුසුකම් ඇති) අයෙකු ඔබට සපයා ගත හැකි ද? :—————.

12. ඔබ කිසියම් වරදක් සඳහා උසාවියකින් දඬුවම් ලබා තිබේද ? දඬුවම් ලබා ඇත්නම් නඩු අංකය, දෙන ලද දඬුවම් ගැන විස්තර සඳහන් කරන්න :—————.

13. i. ඔබ මීට කලින් තැපැල් දෙපාර්තමේන්තුවේ හෝ රජයේ වෙනත් ආයතනයක හෝ රැකියාවක නියුක්තව සිටියේ ද? :————.
ii. එම රැකියාව පිළිබඳ විස්තර හා ඉන් අස්වීමට හෝ අස් කිරීමට හේතු මොනවා ද ? :—————.

14. ඔබට රු. 3,750ක මුදලක් ඇප මුදල් වශයෙන් තැන්පත් කළ හැකි ද?
:—————.

15. චරිතය හා කාර්ය ශූරතාවය සම්බන්ධයෙන් විනිශ්චයක් දීමට අයදුම්කරු විසින් නම් කරන පුද්ගලයින් දෙදෙනාගේ නම් සහ ලිපිනයන් :

1. ——————.
2. ——————.

16. විභාග ගාස්තුව ගෙවූ තැපැල් කාර්යාලය :——————.
විභාග කුවිතාන්සියේ අංකය :——————.
දිනය :——————.

| |
|---|
| විභාග කුවිතාන්සිය නොගැලවෙන සේ මෙහි අලවන්න. |

17. අයදුම්කරුගේ ප්‍රකාශය :

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයා ඇති තොරතුරු සත්‍ය බවත්, නිවැරදි බවත්, සඳහන් කරමි. මෙහි සඳහන් යම් කරුණක් අසත්‍ය හෝ වැරදි බව තෝරාගනු ලැබීමට පෙරාතුව සොයා ගනු ලැබුවහොත් මා නුසුදුස්සකු බවට පත්වන බවත්, පත්වීම ලැබීමෙන් පසු වරද අනාවරණය වුයේ නම් වන්දියක් නොමැතිව වහාම මා සේවයෙන් පහ කළ හැකි බවත් මම හොඳාකාරවම දනිමි.

මෙම විභාගයේ කොන්දේසි සියල්ල පිළිපැදීමට මම එකඟවෙමි. මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

——————.
අයදුම්කරුගේ අත්සන

දිනය :——————.

18. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරනු ලබන …………මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිටදී …………දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

——————.
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය:——————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :——————.
තනතුර :——————.
ලිපිනය :——————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

19. දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය (අදාළ නම් පමණි)

මෙම ඉල්ලුම්පත්‍රය ඉදිරිපත් කරන …………නමැති අයදුම්කරු/ අයදුම්කාරිය දින සිට මෙම කාර්යාලයේ සේවය කරන බවත්, ඔහුගේ /ඇයගේ වැඩ හා හැසිරීම නිරන්තරයෙන්ම සතුටුදායක බවත්, ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල මෙම කාර්යාලයෙහි ඇති වාර්තා ආශ්‍රයෙන් මම පුද්ගලිකවම පරීක්ෂා කර බැලූ බවත්, ඒවා නිවැරදි බවත් …………දින ඔහු/ඇය මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් මෙයින් සහතික කරමි.

——————.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ හෝ
ඔහුගෙන් බලයලත් නිලධාරියාගේ අත්සන.

දිනය :——————.
ස්ථානය :——————.
සහතික කරන අයගේ සම්පූර්ණ නම :——————.
ලිපිනය :——————.
පදවිය :——————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න) :——————.

## කොළඹ ප්‍රාදේශීය තැපැල් අධිකාරි කොට්ඨාශය/දිස්ත්‍රික්කය

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

01. නුගදණ්ඩ
02. පුවක්පිටිය
03. සාලාව
04. අත්තිඩිය
05. කළුබෝවිල බටහිර
06. දෙහිවල නගර සභාව
07. ශ්‍රී සරණංකර පාර
08. ගල්විහාර පාර
09. නවගමුව පත්තිනිපුර
10. බෝම්රිය
11. ජල්තර හේන්පිට
12. හෝකන්දර
13. මාදිවෙල
14. තලංගම උතුර
15. ජයවඩනගම
16. ගංගොඩවිල
17. කොහුවල
18. තලපත්පිටිය
19. ඔරුගොඩවත්ත
20. ඇන්ඩර්සන් තට්ටු නිවාසය
21. පොල්හේන්ගොඩ
22. නාරාහේන්පිට
23. නාවල
24. කොළඹ මහ රෝහල

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

25. පාමංකඩ
26. තෙලවල
27. රත්මලාන උතුර
28. බොරුපන විජයපුර
29. සිරිමල් උයන
30. හබරකඩ
31. මුල්ලේගම
32. කොරලවැල්ල
33. අහුලාන
34. කටුබැද්ද
35. හඳපාන්ගොඩ
36. හොරගල
37. බටුගම්පල
38. අංගම්පිටිය
39. කොස්හේන හන්දිය
40. බෝකුන්දර
41. සිද්ධමුල්ල
42. දැල්තර
43. ආදුරුප්පුවීදිය
44. කොළඹ කච්චේරිය
45. ආමර් වීදිය
46. බේස්ලයින් පාර
47. ගෝතමී පාර
48. විද්‍යෝදය විශ්ව විද්‍යාලය
49. නාවින්න

ගම්පහ දිස්ත්‍රික්කය

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

01. අලුතැපොල
02. ආඬිඅම්බලම
03. බඩල්ගම
04. බම්බුකුලිය
05. බත්ගම්මුල්ල
06. බොකලගම
07. බොල්ලෑගල
08. බෝමුණුව
09. බුළුගහගොඩ
10. බෝපිටිය හන්දිය
11. දංගහවෙල
12. දලුපොත
13. බෝලගල
14. බෝපාගම
15. දළුවකොටුව
16. දෙහිගහහේන
17. දැවමොට්ටාව
18. දූනගහ
19. දූව
20. එළුවාපිටිය
21. ඒපාමුල්ල
22. ඉදිපරපේ
23. ගුරුවල
24. ගොංගිතොට
25. හපුගොඩ
26. හෙයියන්තුඩුව උතුර
27. කහටෝවිට
28. කලගෙඩිහේන
29. කලල්පිටිය
30. කලෝටුවාව
31. කටුවැල්ලේගම
32. කපුගොඩ
33. කීනවල
34. කෙහෙල්ඇල්ල
35. කොස්සින්න
36. කොටදෙනියාව
37. කොටරුපේ
38. කුඩහකපොල
39. කුරන බෝලවලාන
40. කුරුකුලාව
41. මල්වතුහිරිපිටිය
42. මගලේගොඩ
43. මඩිත්තගම
44. මයිලවලාන
45. මහර
46. මඩකොටුව
47. මාරපොල
48. මාතම්මන
49. මාදෙල්ගමුව
50. මුද්දරගම
51. මුදුන්ගොඩ
52. මුන්නක්කරය
53. මුරුතාන
54. නැදගමුව
55. නිකහැටිකන්ද
56. නිල්පනාගොඩ

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

57. පාලුගම
58. පත්තලගෙදර
59. පිංගමුව
60. පීල්ලවත්ත
61. පැලියගොඩවත්ත
62. පොල්හේන
63. පෝරුතොට
64. රදාවඩුන්න
65. සියඹලාපේ
66. තෙල්වත්ත හන්දිය
67. තිහාරිය
68. තිත්තපත්තර
69. තිඹිරිගස්කටුව
70. වනවාසල
71. වල්පොල බප
72. වැලිහේන හන්දිය
73. වැබොඩ
74. වැගොව්ව
75. වැලිය
76. වේරහැර
77. යාගොඩ
78. උඩමාපිටිගම
79. උස්වැටකෙයියාව
80. වතුමුල්ල

කලුතර දිස්ත්‍රික්කය

01. දොබගොඩ
02. හොරන මාහේන
03. මූණගම
04. හොරන උතුර
05. මිල්ලෑව
06. කනන්විල
07. මොරගහහේන
08. අරඹනාගොල්ල
09. පරගස්තොට
10. මීවනපලාන
11. හොරන කඩවීදිය
12. තොටවත්ත
13. වලාන
14. එළුවිල හන්දිය
15. බෙක්කේගම
16. පල්ලිමුල්ල
17. අරුක්ගොඩ
18. කුරුප්පුමුල්ල
19. කුඩාහීනටියන්ගල
20. කළුතර දියගම
21. සපුගහවත්ත
22. කොහොලාන
23. ඇතගම
24. බොලොස්සගම
25. කලපුගම
26. පුහාඹුගොඩ
27. පොලිස් අභ්‍යාස විද්‍යාලය
28. බඳනාගොඩ
29. එගොඩවත්ත
30. මාලිගාහේන
31. ගිරිකොල

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

32. මෝල්කාව
33. වේයන්ගොල්ල
34. වෙදවත්ත
35. දනවල-කීනියාවල
36. දිවලකඩ
37. බෝතලේගම
38. පරගොඩ
39. දෙල්මැල්ල
40. හිරිගල්ගොඩැල්ල
41. පොතුවිලපුර
42. කොස්හේන පඩේ
43. මුංහේන
44. රෙමුරන
45. හැඩිගල්ල ජනපදය
46. බොන්දුපිටිය
47. රේරුකාන ජනපදය
48. වීදියගොඩ
49. පොතුපිටිය (බප)
50. නාරාවිල
51. හල්වල
52. ඉද්දගොඩ
53. පරෙයිගම
54. වෙට්ටුම කඩ හන්දිය

රත්නපුර දිස්ත්‍රික්කය

01. ඇලපාත
02. ඇල්ලගාව
03. ගිලීමලේ
04. ගොණකුඹුර
05. ඉහල හකමුව
06. ඉහල රත්ගම
07. මාරපන
08. කරඳන
09. කැටේපොල
10. ලෙල්ලෝපිටිය
11. මුද්දුව - මුවගම
12. පැල්වාඩිය
13. රත්තුරුගල
14. සමන්පුර
15. තොරගල්ල
16. හඳගිරිය
17. කොන්ගස්තැන්න
18. හතරබාගේ
19. රාස්සගල
20. විකිලිය
21. මස්පැන්න හෙලකන්ද
22. බෝපැත්ත
23. එල්ලාවල
24. ඇරුපොල
25. ඇඹිලිපිටිය කඩවීදිය
26. ගහේයාය
27. මොරකැටිය
28. ගබ්බෙල
29. මාකඳුර සබර
30. උඩහ හමුපේ
31. වැල්ලඳුර
32. දම්ගලගම

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

33. පනාපොල
34. මඩබද්දර
35. දෙහිපහල
36. නඩුකාරදෙනිය
37. පාතගම සබර
38. අම්බලන්පිටිය
39. බෝධිමළුව
40. එලඋල්ල
41. බොරළුවගෙ අයින
42. ඉළුඹකන්ද
43. කෝපිකැල්ල
44. සූරියකන්ද
45. මහපන්නිල
46. විජේරිය
47. ගවරගිරිය
48. වත්තෙහේන

කෑගල්ල දිස්ත්‍රික්කය

01. හත්ගම්පල
02. දෙයියන්වෙල
03. පල්ලේකනුගල
04. උතුරු අම්තිරිගල
05. අටුලුගම්පුර
06. නිල්වල
07. බස්නාගල
08. දෙමැද
09. මියනවිට
10. යටිවල
11. කිරිහේන
12. බොරුක්ගමුව
13. ඇඳුරාපොත
14. වේරගොඩ
15. ඔරේන්ජ්ගෝව්
16. වෙනිවැල්තුඩුව
17. දුනුකේවෙල
18. දෙල්දෙනිය
19. මාදෙයියාව
20. වතුර
21. ගෝනගමුව
22. හිග්ගොඩ
23. අටුගොඩ පුස්සැල්දෙනිය
24. දෙවනගල
25. කෙසෙල්පත්තල
26. රහල නැගෙනහිර
27. සියඹලාපිටිය
28. අඹදෙනිය
29. මාකෙහෙල්වල
30. වැලිවතුර
31. කහවනුගොඩ
32. හරිගල
33. දොඹේමඩ
34. කිරිවල්ලාපිටිය
35. වල්ගම(සබර)
36. රමු/සියඹලන්ගමුව
37. කන්නන්තොට
38. තෙල්කුමුදුවල
39. බස්නාගොඩ

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

40. අලවතුර
41. කනන්ගමුව
42. නියදුරුපොල
43. දුනුමාල
44. වල්ගම්පොත
45. තඹදිය
46. එලිපන්ගමුව
47. බෙරන්නාව

බදුල්ල දිස්ත්‍රික්කය

01. අඹගහවත්ත
02. මස්පන්න
03. හගුන්නාව
04. රිල්පොල
05. විනීතගම
06. තිඹිරිගස්පිටිය
07. මීගහ කිවුල
08. බදුලු ඔය
09. කැබිල්ලේවෙල
10. මලිත්ත
11. මා උස්සා ගොල්ල
12. මියනකඳුර
13. අලුකැටියාව
14. බොරගස්
15. කන්දෙපුහුල්පොල
16. බෝගහකුඹුර
17. ඌව කැන්ද ගොල්ල
18. හෙල පුපුල
19. ඌව දීගල්ල
20. අරාවත්ත
21. සොරබොර ජනපදය
22. අලුත්තරම
23. රිදීමාලියද්ද
24. යල්වෙල
25. හිඟුරුකඩුව
26. කලුගහකඳුර
27. පාලාවත්ත
28. පිංඅරාව
29. කීණීගම
30. පූනාගල
31. ඌව නෙළුව
32. කොලතැන්න
33. ඌව නාවෙල
34. හෙල කිරින්ද
35. ගලහගම
36. කහගොල්ල
37. විදුරුපොල
38. ඇල්ලෙවෙල අභයපුර
39. වේල්ල වෙල
40. රිටිගහඅරාව
41. දෙහිගම
42. ඌව කොස්ගම
43. මිරිය බැද්ද
44. වරාදොල
45. මිදුම්පිටිය

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

මොනරාගල දිස්ත්‍රික්කය

01. ඉහල නිකවැව
02. කන්ද උඩපංගුව
03. අයිවෙල
04. සෙල්ලකතරගම
05. කිරිඉබ්බන් වැව
06. යල්කුඹුර
07. මහගම ජනපදය
08. අළුපොත

හම්බන්තොට දිස්ත්‍රික්කය

01. නෝනාගම හන්දිය
02. සියඹලාකොටේ
03. ඉහල බෙලිගල්ල
04. බඳගිරිය ජනපදය
05. ගොන්නොරුව
06. මහලේවාය
07. බෙරලිහෙල
08. සඳගිරිහල
09. රුක්මල්පිටිය
10. රම්මලේ කන්ද ජනපදය
11. කාරියමඩිත්ත
12. උස්වැව
13. ගලගම
14. කහඳමෝදර
15. තලුන්න
16. උනාකුරුව
17. පල්ලෙකන්ද
18. අත්තනයාය පත්ගම්විල
19. මොරයාය
20. මුල්ගිරිගල
21. හකුරුවෙල
22. මැදමුලන
23. වැකඳවල

**2006.12.31** දින මාතර දිස්ත්‍රික්කය

01. මල්දුව
02. දියලපේ
03. ගංහැල
04. ඌරුමුත්ත
05. තිබ්බොටුවාව
06. තලහගම
07. විල්පිට
08. කියැඩුව
09. කීරවලගම
10. ගන්දරාවත්ත
11. මඩන්වැල්ල
12. තැඹිලියපොල
13. කරතොට
14. නරවැල්පිට
15. රදාවෙල
16. මීඇල්ල
17. කෝංගල
18. මාපලාන
19. ගනාර

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

20. තල්අරඹ
21. ලැබීම් හන්දිය
22. දම්පහල
23. මොලොක්ගමුව
24. පොත්දෙනිය
25. නයියන්වෙල බණ්ඩත්තර
26. වල්ගම
27. පිලදූව
28. පොල්හේන
29. ගබඩාවීදිය
30. හේවගෙවත්ත
31. හිත්තැටිය
32. ඇහැලකන්ද
33. අපරැක්ක
34. බැද්දෙගම්මැද්ද
35. මුලටියන හන්දිය
36. රන්සෑගොඩ
37. පලොල්පිටිය
38. තලල්ල
39. වල්පොල
40. වේහැල්ල
41. මුරුතගස්පිටිය
42. දංදෙනිය
43. ඇල්කනත්ත ජනපදය
44. හුලංකන්ද
45. කප්පරතොට
46. හල්ලල
47. උඩුකාව
48. වල්ලිවල
49. අලුත්වීදිය වැලිගම
50. වැලිහිඳ ජයවික්‍රමපුර
51. දැරංගල
52. සියඹලාගොඩ
53. විහාරමල්දෙනිය
54. කදුරුවාන
55. කොඩිකාරගොඩ
56. දෙල්ලව
57. කිතලගම
58. උඩුදමන
59. හොරගොඩ
60. නාරංගල
61. සුල්තානාගොඩ
62. අකුරුගොඩ
63. වලකන්ද

ගාල්ල දිස්ත්‍රික්කය

01. අම්බලන්වත්ත
02. බානගල
03. ඇතුමලේ
04. ගාල්ල කඩවීදිය
05. කළුවැල්ල
06. කලේගාලන හන්දිය
07. කරාපිටිය
08. කොස්ගහහේනනාවල
09. ලබුදූව
10. මල්ගල්ල - තංගල්ල
11. මාබොටුවත්ත

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

12. මැදකීඹිය
13. නරාවල
14. නරාවල සීවුස් හන්දිය
15. පහළ කීඹිය
16. පත්තිමුල්ල පනාගොඩ
17. රත්න උදාගම
18. රිච්මන්ඩ් කන්ද
19. තල්ගම්පොල
20. යටලවත්ත
21. ආරච්චිගේවත්ත
22. කතළුව
23. තිත්තගල්ල
24. ගොඩහේන
25. කහව
26. මාදම්පාගම
27. තිලකපුර
28. අම්පේගම
29. නයාපානමුල්ල
30. නුගේතොට
31. උහන්විටිය
32. ඇඳදොල
33. කටුපල බලපිටිය
34. අමුගොඩ
35. හිපන්කන්ද
36. වල්ලබගල
37. කොග්ගල
38. තල්පේ
39. හැගල්ල
40. දංගහවිල හන්දිය
41. දකුණු මාගල
42. තලගහවත්ත
43. රන්තොටුවිල
44. කනත්තගොඩ
45. මැටිපලිය
46. දීගොඩ දිවෙල්හේන
47. හම්පේ
48. ගලගොඩඅත්ත
49. ඉහලගොඩ
50. අම්බල (දප)
51. තෙල්වත්ත
52. රැකඩහේන
53. වැලිවත්ත හන්දිය
54. ඕමන්ත
55. ගුරුසිංහගොඩ
56. හල්පාතොට
57. ගොවියාපාන
58. මන්තක
59. පොල්වත්ත හන්දිය
60. හල්විටිගල ජනපදය
61. බලපිටිය උසාවිය
62. පිටුවලගම

මාතලේ දිස්ත්‍රික්කය

01. කන්දලම
02. බෙලිගමුව
03. අඹන
04. පුබ්බිලිය

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

05. තලංගොඩ හන්දිය
06. දේවගිරිය
07. හඳුන්ගමුව
08. දුල්ලෑව
09. සැලගම
10. ඉලුක්කුඹුර
11. මනන්වත්ත
12. ඇතාබැඳිවැව
13. ජානකගම
14. කරගහහින්න
15. දඹව
16. නිකුල
17. අලකොළමඩ
18. ගොන්ගාවල කඩවීදිය

නුවරඑළිය දිස්ත්‍රික්කය

01. අඹගමුව - උඩුබුලත්ගම
02. අඹතලාව
03. හැබ්බැකන්ද
04. හරස්බැද්ද
05. කුඹුක්වෙල
06. වටද්දර
07. ලක්ෂපාන
08. මොරහේනගම
09. නවබෝගහවත්ත
10. පතන
11. රොසැල්ල
12. මහකුඩුගල
13. මාස්වෙල
14. ඩයගම කඩවීදිය
15. දුනුතුඩුඹය
16. රොජසන්ගම
17. නව මීරියබැද්ද
18. යටිමාදුර
19. පට්ටිපොල
20. අඹේවෙල
21. ගාමිණීපුර
22. සීතාඑළිය
23. හග්ගල
24. හාවාඑළිය
25. ටොප්පාස්
26. මුංවත්ත
27. කුරුපනාවෙල
28. මඩුල්ල
29. මොරහෙල කන්දෙයාය
30. කුඹල්ගමුව
31. කීර්තිබණ්ඩාරපුර
32. ඉහල පන්නල
33. කුඹල්ඔලුවගම

මහනුවර දිස්ත්‍රික්කය

01. කසාවත්ත
02. කුරුගොඩ
03. තෙලඹුගහවත්ත
04. කන්දඅලුපොතකඩ
05. බටගොල්ලදෙනිය

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

06. මිණිගමුව
07. කොබ්බෑගල
08. උඩුව
09. මහපට්ටිපොල
10. දුන්කුඹුර
11. දංගොල්ල
12. සෙංකඩගල බෝවල
13. සුදුහුම්පොල
14. වීරකෝන් උද්‍යානය
15. අඹතැන්න
16. පස්ගම හේවාවිස්ස
17. හුළුගහ
18. පල්ලේබොවල
19. බව්ලාන
20. මහමැදගම
21. බූටාවත්ත
22. යටවර
23. උල්ලඳුපිටිය
24. ඕවිස්ස
25. පට්ටියගම
26. වනහපුව
27. අම්බලපිටිය
28. දුනුකේඋල්ල
29. කොහොමඩ
30. මහමුල්ගම
31. සිංහපිටිය
32. තැඹිලිගල
33. උලපනේ
34. විමලධර්මපුර
35. නව ඇල්පිටිය
36. ඇම්බැක්ක
37. ලංකාතිලක
38. පිලිගල්ල
39. මහ අලපලාවල
40. බරවර්ධන ඔය
41. ලේවැල්ල
42. මයිලපිටිය
43. පිල්වල
44. මහදඹේගොඩ
45. දුම්බරසිරි
46. පල්ලේකැලේ කාර්මික ජනපදය
47. මාංගොඩ
48. බලන්තොට
49. දෙකිඳ
50. ගෝනවල පතන
51. ඒදඬුවාව
52. හල්ඔය
53. දොලුවගම
54. ගිරාගම
55. හැපාන
56. මල්ගම්මන
57. උඩුනුවර පමුණුව
58. වට්ටප්පොල
59. වතුපොල
60. ගොමගොඩ
61. විජයශ්‍රීගම
62. ගලබොඩවත්ත

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

63. කුරුකොහොමඩ
64. රංගල
65. මඩුගල්ල
66. මහලුණුගම
67. දොරගමුව
68. අම්බුලුවාව
69. වැතලාව

පොලොන්නරුව දිස්ත්‍රික්කය

01. දිවුලාන
02. පො/නව නගරය
03. තල්පොත
04. උණගලා වෙහෙර
05. ඇල්ලේවැව
06. කාශ්‍යපපුර
07. නුවරගල
08. අසේලපුර
09. සුංගාවිල
10. සුංගාවිල පුරාණගම
11. මිනිහිරිගම
12. මීවත්පුර
13. රුහුණුගම
14. අත්තනකඩවල
15. දියසෙන්පුර
16. සිංහගම
17. හිඟුරක්දමන
18. මීගස්වැව
19. පැලම්ටියාව
20. මහපලාකොග වැව

අනුරාධපුර ප්‍රා. තැ. අ. කොට්ඨාසය/දිස්ත්‍රික්කය

01. ගල්කුලම
02. පණ්ඩුකාභයපුර
03. අනුරාධපුර ශුද්ධ නගරය
04. අනුරවිජේපුර
05. ඉහල කොටිකාව
06. ශ්‍රාවස්තිපුර
07. වහමල්ගොල්ලෑව
08. අළුත්ගම හැළඹගස්වැව
09. අනුරාධපුර මහලේකම්
10. පොතානේගම
11. තල්ගහවැව
12. රත්නායකපුර
13. තන්තිරිමලේ
14. දේවානම්පියතිස්සපුර
15. පෙරිමියන්කුලම්
16. කහපන්විලගම
17. ඉහල හල්මිල්ලෑව
18. හල්මිල්ලෑව දඹුල්ල
19. පුබ්බෝගම
20. සේනාධිරයගම
21. මොරකාව
22. දෙමටවැව
23. හො/පතානකඩවීදිය (හොරොව්පතාන)
24. කාගම
25. හිරිපිටියාගම

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

26. මුකිරියාව
27. රන්පත්විලගම
28. මිමින්නාවල
29. පුලියන්කඩවල
30. ගෝනුහත්දෙනාව
31. හල්මිල්ලවැටිය
32. හඳගල කිරිමැටියාව
33. කලවැදි උල්පොත
34. තිත්තගෝණෑව
35. වාහල්කඩ
36. මහඇලගමුව
37. ඔලුකරඳ හන්දිය
38. ගනේවල්පොල
39. පලාගල
40. ලබුනෝරුව
41. කට්ටමුරිච්චාන
42. දම්පැලැස්සගම
43. පෙරියකුලම
44. රඹකුලම
45. හීරල්ලුගම
46. රත්මල්ගහවැව
47. රුවන්ගම
48. කනදරා කටුකැලියාව
49. මරදන්කල්ල
50. මහකනදරාව
51. පහලහල්මිල්ලෑව
52. බෝගහවැව
53. සම්පත්නුවර
54. මහසෙන්පුර
55. පදවි ශ්‍රීපුර
56. නෙකමුණුවැව
57. මහබෙල්ලන්කඩවල
58. කරගහ වැව
59. කිරලෝගම
60. තෙල්හිරියාව
61. රාජාංගනය
62. ලුණුවැව
63. කලංකුට්ටිය
64. හුරීගස්වැව
65. අවුකන
66. නාමල්පුර
67. දුටුවැව
68. මයිලගස්වැව
69. ගැටලාව
70. මානන්කට්ටිය
71. උණගොල්ලෑව

කුරුණෑගල දිස්ත්‍රික්කය

01. අඹගම්මන
02. අලව්ව කඩවීදිය
03. බෝගාමුල්ල
04. බොරළුවැව
05. බම්මන්න
06. දඹදෙණි පරණගම
07. දීකිරිනෑව
08. ගොන්නාව
09. ගෝනුල්ල

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

10. හම්මලව
11. හීරලුවල්පොල
12. ඉහලකඩිගමුව
13. ඉලුක්හේන
14. ඉහුරුවත්ත
15. ඉංගරදවුල
16. ඊරියගොල්ල
17. කන්තේවැව
18. ලෝකාහෙට්ටිය
19. මකුලාගම
20. මහරච්චිමුල්ල
21. මලගනේ
22. මැටියගනේ
23. මීතැන්වල
24. මීවැව
25. මිරිහානේගම
26. නාරංගොඩ
27. නාබිරිත්තන්කඩවල
28. පහල දියදොර
29. පරගහදෙනිය
30. පිහිඹියරත්මලේ
31. තලහේන්ගොඩ
32. නාවල්ල
33. වල්පිටගම
34. වැල්ලැගල
35. වැවගම
36. වල්ලැව හොරගල
37. වතුවත්ත
38. යගම්වෙල
39. ඇහැටුවැව
40. ඇබෝගම
41. අරගම
42. බමුණකොටුව
43. බෝයගනේ
44. බරන්දන
45. දළුපොතගම
46. දෙමටළුව
47. දෙමටගොල්ල
48. දිවුල්ලැව
49. ගෝනගම
50. ගැට්ටුවාන හන්දිය
51. ගන්කිරියාව
52. හිදගොල්ල
53. හිරිගල ලේනව
54. හේවාපොල
55. ඊතණවත්ත
56. කනෝගම
57. කැත්තපහුව
58. කිරිඳිගල්ල
59. කෝන්පොල
60. කුඩාගල්ගමුව
61. කුරුණෑගල කඩවීදිය
62. මාදුරාගොඩ
63. මහමුකලන්යාය
64. මකුල්පොත
65. මකුල්වැව

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

66. මාස්පොත
67. මාළිගිය
68. මඩියාව
69. මීන්හෙට්ටිය
70. නැබඩාව
71. පල්ලෙයාය
72. පෙරියකඩුනැලව
73. රනවන
74. රත්මල්ල
75. රෝහල හන්දිය
76. සාලිය අශෝකපුර
77. සෝල්ලේවැව
78. සෝල්ලේපුර
79. තඹගල්ල
80. තෙලියගොන්න
81. වත්නිදාගම
82. වලලිය
83. වැවගෙදර
84. විල්ගොඩ
85. වන්නිගම
86. යාලව
87. යාපහුව
88. මකුලැව

හලාවත පුත්තලම දිස්ත්‍රික්කය

01. කල්අඩිය
02. මහඋස්වැව
03. මුදලන්කුලිය
04. මැදවක්කුලම
05. නල්ලකරන්කට්ටුව
06. කරුකුපනේ
07. ඉරණවිල
08. අළුත්තොට
09. ගොඩැල්ල
10. කිරිමුන්දලම
11. පල්ලියවත්ත
12. ලංසිගම
13. ගල්මුරුව
14. හත්තිනිය
15. කුඩාවැව
16. කුඩාමඩු
17. තෝලුවාව
18. දෙමටපිටිය
19. කොස්වත්ත
20. කොට්ටන්තිව්
21. සම්රගම
22. අට්ටවිල්ලුව
23. පුත්තලම සිමෙන්ති කම්හල
24. සිරම්බිඅඩිය
25. තබ්බෝව
26. දුන්කන්නාව
27. ඉගිණිමිටිය
28. ඉහල පුලියන්කුලම
29. නාරවිලගම
30. කටුකෙන්ද බටහිර
31. කුරුකැටියාව

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

වවුනියා දිස්ත්‍රික්කය

01. වෙන්මා මාඩුකුලම්
02. ඉරානෙයි ඉලුපයික්කුලම්
03. කනගරායන්කුලම්
04. ඕමන්තෙයි
05. පාලමොඩයි
06. පෙරියන්තම්පානයි
07. පුලියන්කුලම්
08. සන්තිකෝලම්කුලම්
09. මරුතෝඩයි (තාවකාලිකව වසා ඇත)
10. කන්නඩ්ඩි

මන්නාරම ප්‍රා. තැ. අ. කොට්ඨාසය/දිස්ත්‍රික්කය

01. පරප්පුකඩල්නාත්
02. කොක්කුපඩයන්
03. පන්ඩරවේලි
04. මුල්ලිකුලම්
05. පී. පී. පොට්කර්නි
06. නානතන්
07. කරිසාල්
08. තිරුකෙතීශ්වරන් කෝවිල

කිලිනොච්චිය දිස්ත්‍රික්කය

01. ස්කන්ධපුරම්
02. තිරුවාගුරු
03. වන්නේරිකුලම්
04. එලිෆන්ට්පාස් (තාවකාලිකව වසා ඇත)
05. කිලාලි
06. අලියවාලායි
07. මුල්ලයාන්
08. සිවනගර්
09. කච්චිතරිමුනෙයි
10. පලවරායන්කඩ්ඩු

යාපනය දිස්ත්‍රික්කය

01. අලවෙඩ්ඩි උතුර
02. අල්වායි
03. අතියාඩි
04. ඩෙල්ෆ් නැගෙනහිර
05. ඩෙල්ෆ් බටහිර
06. යාපනය විශ්ව විද්‍යාලය
07. යාපනය කච්චේරිය
08. කයිතඩි උතුර
09. කරම්පන් දකුණ
10. කරනවායි දකුණ
11. කොකුවිල් බටහිර
12. කුඩත්තනායි
13. කුප්පිලාන්
14. මන්කුම්බන්
15. මන්තුවිල්
16. මරිසන්කෝඩාල්
17. මල්ලාකම්
18. මරුතඩි
19. මත්තගල්

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

20. මුවර් වීදිය
21. නාගර් කෝවිල්
22. නවන්තුරෙයි
23. නවින්ඩිල්
24. නෙල්ලන්ඩායි
25. පන්නාකම්
26. පසායූර්
27. පුලියන්කොඩ්ඩාල්
28. පුලෝලි
29. රත්නලඩි
30. සලම්බායි
31. සන්ගුවේලි
32. සන්දිලිපේ
33. තෙලිප්පලෙයි බටහිර
34. තම්බසිඩ්ඩි
35. තවාඩි
36. නික්කම්
37. තිරුනාවෙලි හන්දිය
38. තිරුනාලි
39. උඩුවිල්
40. ඌරතිව්
41. වලන්තලායි
42. වල්ලාන්
43. විලාන්
44. වාල්වෙට්ටි
45. වේලානෙයි බටහිර
46. ව්‍යාපාරමුලෙයි
47. කුරුම්බසිඩ්ඩි (තාවකාලිකව වසා ඇත)
48. කිරිමලෙයි (එම)
49. මයිලඩි (එම
50. තයියඩි (එම)
51. උරණි කොස්ට් (එම)
52. තන්නන්කිලප්පු (එම)

මුලතිව් දිස්ත්‍රික්කය

01. මුරුක්කන්ඩි
02. තුනුක්කායි
03. වන්නිකුලම්
04. යෝගපුරම්
05. අම්බලවන්පොක්කනායි
06. කෝකිලායි
07. මුල්ලිවයික්කාල්
08. මුන්නයිනඩියන්කඩ්ඩු කුලම්
09. කොකුන්තෝඩුවායි

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

01. වෙල්ලායිමනල්
02. කප්පල්තුරෙයි
03. අග්බෝපුර
04. ගල්මැටියාව
05. ජින්නානගර්

පුරප්පාඩු උප තැපැල් කාර්යාල

ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය

06. කුඹුරුපිඩ්ඩි
07. තිව් ජැටිය
08. මහදිවුල්වැව
09. සාම්පූර්

අම්පාර දිස්ත්‍රික්කය

01. අම්පාර බස් නැවතුම්පල
02. බුද්ධංගල
03. දි/වීරගොඩ
04. බක්මීදෙනිය
05. දොලකන්ද
06. සඳුන්පුර
07. දමන
08. මඩවලලන්ද
09. වරිපතන්චේනයි
10. ටැම්පිටිය
11. දිය විද්දාගම
12. සඳමඩුල්ල
13. කොලමන්තලාව
14. රජගලතැන්න
15. නෙල්ලියද්ද

මඩකලපුව ප්‍රා. තැ. අ. කොට්ඨාසය/දිස්ත්‍රික්කය

01. අම්ර්තකාලි
02. පිල්ලයාර්අඩි
03. තන්නවන්වැලි
04. පුතුනගර්
05. රාමක්‍රිෂ්ණපුරම්
06. අයිතියමලර්
07. කරදියනාරු
08. කලුවන්කර්නි
09. වන්තාරුමූලෙයි
10. චුන්ඩිලයන්
11. කෝවිල්පොරතිව්
12. අම්බිලන්තුරෙයි
13. මන්චෝලෙයිකිරමම්

අක්කරෙයිපත්තු ප්‍රා. තැ. අ. කොට්ඨාසය

1. අක්කරෙයිපත්තුව බටහිර
2. තම්පට්ටයි
3. පනන්කාඩු
4. කල්මුනතිකුඩි
5. කල්මුනේකඩවීදිය
6. කරඩින් තොට්ටම්
7. මාලිගයි කාඩු
8. කයිකාට්ටි
9. සෙන්හෙල්පුරම්
10. මල්කම්පිට්ටි
11. සම්බුමඩු
12. නායිපට්ටි මුනෙයි
13. අල්හිලායි පාර

04 - 454

---

වෘත්තිය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය

ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය

ඉංජිනේරු තාක්ෂණ ආයතනය (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) කටුනායක

ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම - 2007 කණ්ඩායම

කටුනායක, ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ (පෙර තාක්ෂණඥයින් පුහුණු කිරීමේ ආයතනය) ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාව, 2007 කණ්ඩායම සඳහා ඉංජිනේරු විද්‍යා විශේෂ ආධුනිකයින් බඳවා ගැනීම පිණිස ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් මෙයින් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :*

පහත දක්වා ඇති සුදුසුකම් සහිත අයදුම්කරුවන්ට අයදුම්පත් ඉදිරිපත් කළ හැක.

1.1 අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේදී එකවර විෂයයන් 06 කින් සාමාර්ථය ලබා සිටීම සහ විද්‍යාව, ගණිතය සහ භාෂාව යන විෂයයන් සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබිය යුතුය ;

සහ

1.2 (i) අධ්‍යාපන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ - පැරණි නිර්දේශය) විභාගයේදී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය සහ භෞතික විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම ;

හෝ

(ii) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ - පැරණි නිර්දේශය) විභාගයේ දී ශුද්ධ ගණිතය, ව්‍යවහාරික ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් හතර (04) වාර දෙකකදී සමත් වීම ;

හෝ

(iii) අධ්‍යයන පොදු සහතිකපත්‍ර (උසස් පෙළ - නව නිර්දේශය) විභාගයේදී සංයුක්ත ගණිතය, භෞතික විද්‍යාව සහ රසායන විද්‍යාව යන විෂයයන් තුන (03) එකවර සමත් වීම.

2. *වයස.*–2007.12.01 වැනි දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 25 ට නොවැඩි විය යුතු ය.

3. *පුහුණු කිරීමේ කාලය පිළිබඳ වැඩ සටහන් විස්තර :*

මෙම පාඨමාලාවේ කාලය වසර හතරකි. සති 73 ක (ආසන්න වශයෙන්) න්‍යායික උපදෙස් පාඨමාලාව, සති 135 ක (ආසන්න වශයෙන්) ප්‍රායෝගික පුහුණුව සමග පහත දැක්වෙන ආකාරයට සකස් කර ඇත.

මූලික උපදෙස් වැඩසටහන (කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව සහිතව)

| | |
|---|---|
| ඉංජිනේරු තාක්ෂණ (ඉ. තා.) ආයතනයේදී | - සති 27 |
| මූලික ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේදී | - සති 39 |
| සාමාන්‍ය උපදෙස් වැඩසටහන ඉ. තා. ආයතනයේ දී | - සති 23 |
| සාමාන්‍ය ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී | - සති 52 |
| විශේෂ උපදෙස් වැඩහටන ඉ. තා. ආයතනයේ දී | - සති 23 |
| විශේෂ ආයතනික ක්ෂේත්‍ර පුහුණුව කර්මාන්ත ආයතනයේ දී | - සති 44 |

මෙම ඉංජිනේරු පාඨමාලාවට අයත් න්‍යායික උපදෙස් හා පාඨමාලා ප්‍රායෝගික කාර්යයන් මෙම ආයතනයේ දී ලබා දෙන අතර ආයතනික ක්ෂේත්‍ර පුහුණුව පිළිගත් කර්මාන්ත ආයතන මගින් ලබා දෙනු ඇත.

4. *ආයතනය මගින් පවත්වනු ලබන පාඨමාලා පහත සඳහන් පරිදි වේ :.*

අ. *සිවිල් ඉංජිනේරු ක්ෂේත්‍රය :*

1. ගොඩනැගිලි හා ව්‍යුහ ඉංජිනේරු පාඨමාලාව
2. මහාමාර්ග හා දුම්රිය මාර්ග ඉංජිනේරු පාඨමාලාව
3. ජල හා පාරිසරික ඉංජිනේරු පාඨමාලාව

ආ. *විදුලි ඉංජිනේරු ක්ෂේත්‍රය :*

4. විද්‍යුත් ඉංජිනේරු පාඨමාලාව
5. විදුලි බල ඉංජිනේරු පාඨමාලාව
6. විදුලි සංදේශ ඉංජිනේරු පාඨමාලාව

ඇ. *යාන්ත්‍රික ඉංජිනේරු ක්ෂේත්‍රය :*

7. යාන්ත්‍රික (ස්වයංචලන) ඉංජිනේරු පාඨමාලාව
8. යාන්ත්‍රික (සාමාන්‍ය) ඉංජිනේරු පාඨමාලාව
9. නාවික ඉංජිනේරු පාඨමාලාව

(අ) ඉංජිනේරු තාක්ෂණ ආයතනයේ නාවික ඉංජිනේරු පාඨමාලාව (අංක 9) තත්ත්ව කළමනාකරණ පද්ධතිය ISO 9001-2000 හි දක්වා ඇති අවශ්‍යතා පරිදි පැවැත්වේ.

(ආ) නාවික ඉංජිනේරු පාඨමාලාව සැළසුම් කොට ඇත්තේ අන්තර්ජාතික සමුද්‍ර සංවිධානයේ STCW-95 සහ 7.04 ආදර්ශ පාඨමාලාව හා සම්බන්ධිත නාවික ඉංජිනේරු කාරක මට්ටමේ දැනුම, අවබෝධය සහ ප්‍රවීණතාව පිළිබඳ විධානානුකූල අවශ්‍යතා සපුරාලනු පිණිස වේ.

5. උපදෙස් මාධ්‍යය - මෙම පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි භාෂාවෙනි.

6. *ආධුනිකත්ව ගිවිසුම–*

6.1 තෝරාගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා, ඉංජිනේරු තාක්ෂණ ආයතනය සහ පුහුණු කිරීමේ ආයතනය යන තිදෙනා වෙතම අන්‍යොන්‍යය වගකීම් පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු අතර පාඨමාලාවට ලියාපදිංචි වන අවස්ථාවේදී පාඨමාලාව අවසානයේ ආපසු ගෙවනු ලබන රුපියල් 5,000 ක තැන්පතු මුදලක් ලබා දිය යුතු ය. (සමෘධි ලාභීන්ට මෙය අදාල නොවේ) පාඨමාලාව අතරමග හැර යන සිසුන්ට මෙම මුදල ආපසු ගෙවනු නොලැබේ.

6.2 කර්මාන්ත පුහුණු අවස්ථාවලදී ආධුනිකයා සහ පුහුණු ආයතනය අතර ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතු ය.

6.3 පුහුණුව අවසාන වීමෙන් පසුව ආධුනිකයින් සඳහා රැකියා සැපයීමට ආයතනය බැඳී නොමැත.

6.4 මෙම පාඨමාලා සඳහා ලියාපදිංචි වන සියළුම සිසුන් මුළු පාඨමාලා කාලය තුළ 80% අවම පැමිණීමේ ප්‍රතිශතයක් පවත්වා ගෙන යා යුතු ය. එසේ නොවන අවස්ථා වලදී අදාල විභාග වලට පෙනී සිටිය නොහැකි අතර ඔවුන්ට එම කණ්ඩායමෙන් ඉවත් වී පසු කණ්ඩායම සමග අධ්‍යයන කටයුතු කිරීමට සිදුවේ.

7. *සහතික ප්‍රදානය–*

සාර්ථක ලෙස පුහුණුව අවසන් කර සමත්වන ආධුනිකයින්හට ඉංජිනේරු විද්‍යා ජාතික ඩිප්ලෝමා සහතිකය ප්‍රදානය කරනු ඇත.

8. *තෝරා ගැනීමේ ක්‍රමය :*

8.1 ඉහත අංක 1 ඡේදයෙහි සඳහන් ඇතුලත් කර ගැනීම සඳහා වූ අවම සුදුසුකම් සහිත අංක 2 ඡේදයෙහි සඳහන් වයස සීමාව තුළ වූ අයදුම් කරුවන්ගෙන් පහත දැක්වෙන ක්‍රමයට තෝරා ගැනීම සිදු කරනු ලැබේ. (ඡේදය 9.8 ද බලන්න)

8.2 මූලික සුදුසුකම් සපුරා ඇති සියලුම අයදුම්කරුවන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් වූ ලිඛිත යෝග්‍යතා පරීක්ෂණයකට පෙනී සිටිය යුතු ය. (ලිඛිත යෝග්‍යතා පරීක්ෂණය සඳහා සුදුසුකම් ලබන සියලුම අයදුම්කරුවන් වෙත කල් වේලා ඇතිව ඒ බව දැනුම් දෙනු ලැබේ.)

8.3 ලිඛිත පරීක්ෂණයෙන් ලබාගත් ලකුණු හා සම්මුඛ පරීක්ෂණයක් මගින් විවිධ කේෂ්ත්‍ර/විශේෂීකරණ සඳහා ආධුනිකයින් තෝරාගනු ඇත.

8.4 නාවික ඉංජිනේරු ක්ෂේත්‍රය සඳහා තෝරා ගනු ලැබූ අයදුම්කරුවන් ඔවුන් එම ක්ෂේත්‍රයේ ලියාපදිංචි වීමට පෙර ඔවුන්ගේ වියදමින් වෛද්‍ය පරීක්ෂණයකට භාජනය විය යුතුය.

9. *අයදුම්පත් :*

9.1 අයදුම්පත් සහ ආයතනය පිළිබඳ වැඩි විස්තර www.iet.edu.lk යන වෙබ් අඩවියෙන් ලබා ගත හැක. තවද,

9.2 කටුනායක, පන්සල පාරේ, ඉංජිනේරු තාක්ෂණ ආයතනයට පැමිණ රු. 50 ක් ගෙවීමෙන් හෝ තැපෑලෙන් අවශ්‍ය නම් රු. 50 ක් වටිනා මුදල් ඇණවුමක් සහ මුද්දර ගැසූ ලිපිනය ලියන ලද අඟල් 9 x 4 ප්‍රමාණයේ ලියුම් කවරයක් ලේඛකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක (දුරකථන : 011-2252833, 011-2252834) යන ලිපිනයට එවීමෙන් 2007 ජුනි මස 20 වැනි දින දක්වා අයදුම්පත් ලබාගත හැක.

9.3 මෙයට අමතරව පහත දැක්වෙන ප්‍රධාන කාර්යාලය, ජාතික ආයතන සහ පළාත් කාර්යාල වලට පැමිණ රු. 50 ක් ගෙවීමෙන්ද 2007 ජුනි මස 20 වැනි දින දක්වා අයදුම්පත් මිලදී ගත හැක.

(i) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය, 971, ශ්‍රී ජයවර්ධනපුර මාවත, වැලිකඩ, රාජගිරිය. දුරකථන අංක : 011-2863680, 011-2867435

(ii) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය, අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව දුරකථන : 011-2647393, 011-2641092

(iii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, අංක 07, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, ඔරුගොඩවත්ත, වැල්ලම්පිටිය දුරකථන : 011-2572977, 011-2532182

(iv) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, ඌව පළාත් කාර්යාලය, අංක 288, කුමාරසිංහ මාවත, පස්සර පාර, බදුල්ල දුරකථන : 055-2222608

(v) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, සබරගමුව පළාත් කාර්යාලය, නව කොළඹ පාර, විද්‍යාල මාවත, නව නගරය, රත්නපුර දුරකථන : 045-2228667

(vi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, දකුණු පළාත් කාර්යාලය, අංක 27ඒ, විවෘත විශ්ව විද්‍යාල මාවත, නූපේ, මාතර දුරකථන : 041-2226958

(vii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, මධ්‍යම පළාත් කාර්යාලය, අංක 108/2B, තිවංක බෝධි මාවත, මුල්ගම්පොල, මහනුවර දුරකථන : 081-2201918

(viii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු මැද පළාත් කාර්යාලය, දෙවන පියවර, අංක 525/2, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුරය, දුරකථන : 025-2225504

(ix) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, වයඹ පළාත් කාර්යාලය, ජාතික තරුණ සේවා සභාව අසල, මීගමුව පාර. මල්කඩුවාව, කුරුණෑගල, දුරකථන : 037-2221865

(x) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, උතුරු පළාත් කාර්යාලය, අංක 07, කෝවිල පාර, යාපනය, දුරකථන : 021-2222383

(xi) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, නැගෙනහිර පළාත් කාර්යාලය, අංක 7, ග්‍රාමසේවක පාර, කල්මුනේ කුඩි 13, කල්මුනේ දුරකථන : 067-2229357

(xii) ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය, බස්නාහිර පළාත් කාර්යාලය, අංක 242, හැව්ලොක් පාර, කොළඹ 05. දුරකථන : 011-2597671-2, 011-2587258

9.4 සිය අයදුම්පත ඉහත ආයතනයකින් ලබා ගන්නා සෑම අයදුම් කරුවෙකු විසින්ම එය ඉදිරිපත් කිරීමේදී රු. 200 ක මුදලක් (9.6 ප්‍රකාර) ගෙවිය යුතු ය. මෙම මුදල දිවයිනේ පිහිටි මහජන බැංකුවේ ඕනෑම ශාඛාවකට ගෙවිය හැකිය.

9.5 අයදුම්පත් වෙබ් අඩවියෙන් ලබා ගෙන එම අයදුම්පත මගින් ඉල්ලුම් කිරීමේදී අදාල අයදුම්කරුවන් රු. 250 ක මුදලක් (9.6 ප්‍රකාර) මහජන බැංකුව වෙත ගෙවිය යුතු ය.

9.6 මුදල් තැන්පතු තුණ්ඩුව පහත සඳහන් කරුණු සහිතව නිසි පරිදි සම්පූර්ණ කළ යුතු ය.

(i) ශාඛා අංකය සහ ගිණුම් අංකය - 174-100170347379.
(ii) බැර උපදෙස් - මහජන බැංකුව, නුගේගොඩ, ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරියේ රැස් කිරීමේ ගිණුම් අංක 174-100170347379 ට බැර පිණිස,
(iii) අයදුම්කරුගේ නම සහ ලිපිනය

9.7 නිසි පරිදි සම්පූර්ණ කරන ලද අයදුම්පත, මුදල් ගෙවීම් කරන ලද බැංකු ශාඛාවේ බලයලත් නිලධාරියෙකු විසින් සහතික කරන ලද තැන්පතු රිසිට්පත අයදුම්පත සමග අමුණා 2007 ජූනි මස 22 වැනි දින හෝ ඊට ප්‍රථම ලියාපදිංචි තැපෑලෙන් අධ්‍යක්ෂ/විදුහල්පති, ඉංජිනේරු තාක්ෂණ ආයතනය, පන්සල පාර, කටුනායක යන ලිපිනයට එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් හෝ අතින් ගෙනැවිත් භාරදෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

9.8 <u>රජයේ කාර්මික ආයතනයක හෝ විශ්ව විද්‍යාලයක පූර්ණ කාලීන ඩිප්ලෝමා පාඨමාලාවක් හෝ උපාධිය හැදෑරූ හෝ හදාරමින් සිටින අය හෝ අයදුම් කිරීමට සුදුසුකරුවන් නොවේ.</u>

9.9 අයදුම්පත සමග සහතික වල මුල්පිටපත් හෝ ඡායා පිටපත් එවිය යුතු නැත.

9.10 අයදුම්පත් ලැබුණු බවට අයදුම්කරුවන්ට දැනුම් දෙනු නොලැබේ.

9.11 ඉහත අංක 9.2 හි සඳහන් මුදල් ඇණවුම ගණකාධිකාරී, ඉංජිනේරු තාක්ෂණ ආයතනය නමින් ලබාගත යුතු අතර ගෙවීම් කරන තැපැල් කාර්යාලය කටුනායක විය යුතු ය.

10. තැපෑලේදී නැතිවන හා ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධනේ ඉංජිනේරු තාක්ෂණ ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා කල් ඇතිව සිය අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස අයදුම්කරුවන්ට විශේෂයෙන් දන්වා සිටිනු ලැබේ.

සභාපති.
ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය,

අංක 971,
ශ්‍රී ජයවර්ධනපුර මාවත,
වැලිකඩ,
රාජගිරිය.

04-491

---

## වෘත්තිය හා කාර්මික පුහුණු අමාත්‍යාංශය

### ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීමේ අධිකාරිය

### ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

### *ආධුනිකයන් බඳවා ගැනීම - 2007 ජූලි*

ශ්‍රී ලංකා ජර්මන් ඒකාබද්ධ ව්‍යාපෘතියක් වන ආධුනිකත්ව අභ්‍යාස ආයතනය පහත දැක්වෙන පූර්ණ කාලීන පාඨමාලා හැදෑරීම සඳහා ශ්‍රී ලාංකීය තරුණ තරුණියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

1. පවත්වනු ලබන පූර්ණ කාලීන පාඨමාලා

| *පාඨමාලාවේ නම* | *නිපුණතා පාදක පුහුණුව* | *කාලය* |
|---|---|---|
| 01. කම්බි නැවුම් ශිල්පී | ✓ | අවු. 1/2 |
| 02. ගොඩනැගිලි පින්තාරු ශිල්පී | ✓ | අවු. 1 |
| 03. පෙදරේරු කාර්මික ශිල්පි | ✓ | අවු. 2 |
| 04. ජලනල කාර්මික ශිල්පී | ✓ | අවු. 2 |
| 05. වඩු කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ) | ✓ | අවු. 2 |
| 06. ගුවන් විදුලි හා රූපවාහිනී ආශ්‍රිත උපකරණ අළුත්වැඩියා කරන්නා | ✓ | අවු. 2 |
| 07. ශීතකරණ හා වායු සැකසුම් කාර්මික ශිල්පී | ✓ | අවු. 2 |
| 08. පෑස්සුම් ශිල්පී | ✓ | අවු. 2 |
| 09. ආවුද හා අච්චු තැනුම් ශිල්පි | | අවු. 2 |
| 10. යන්ත්‍රකරු (විශේෂ) | - | අවු. 3 |
| 11. විදුලි කාර්මික (විශේෂ) | - | අවු. 3 |
| 12. ඉලෙක්ට්‍රොනික් කාර්මික (විශේෂ) | - | අවු. 3 |
| 13. පරිගණක යෙදවුම් සහායක | ✓ | අවු. 1 |

මෙම ආයතනය විසින් පවත්වන ලබන ඉහත දක්වා ඇති නිපුණතා පාදක පුහුණු පාඨමාලා වර්තමානයේ ජාත්‍යන්තර ලෙස පිළිගැනෙන සහ ක්‍රියාත්මක වන නිපුණතා පාදක පුහුණු ක්‍රමය CBT යටතේ පැවැත්වීමට කටයුතු යොදා ඇත.

2. ඇතුලත් කර ගැනීම සඳහා අවශ්‍ය අධ්‍යාපන සුදුසුකම් :

2.1 අංක 1 සිට 5 දක්වා වූ පාඨමාලා සඳහා රජයේ ආධාර ලබන හෝ අනුමත කරන ලද පාසලක 8 වන ශ්‍රේණිය සමත් වීම ;

2.2 අංක 6 සිට 12 දක්වා වූ පාඨමාලා සඳහා අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනක දී සිංහල (මාධ්‍ය භාෂාව) සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් සමත්ව තිබීම.

2.3 අංක 13 පාඨමාලාව සඳහා දෙවතාවකට නොවැඩි වාර ගණනක දී සිංහල (මාධ්‍ය භාෂාව) සහ අංක ගණිතය හෝ ගණිතය ඇතුළුව විෂයයන් 6කින් අ. පො. ස. (සා. පෙළ) සමත්ව තිබීම සහ ඉංග්‍රීසි සහ අංක ගණිතය හෝ ගණිතය සඳහා සම්මාන සාමාර්ථ ලබා තිබීම.

*සැ. යු.*– ලැබෙන අයදුම්පත් සලකා බලා ඉල්ලුම්කරුවන්ට ගැලපෙන පාඨමාලාව තෝරා දීමට ලිඛිත පරීක්ෂණ, සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරනු ඇත. ඊට අමතරව අධ්‍යාපන සුදුසුකම් ද විශේෂයෙන් සලකා බලනු ලැබේ.

*වයස.*– 2007.07.01 වැනි දිනට වයස අවුරුදු 16ට නොඅඩු 35ට නොවැඩි විය යුතු ය.

3. *පුහුණුව පිළිබඳ විස්තර* :

සියලුම පාඨමාලා ද්විත්ව පුහුණු ක්‍රමය මත සැළසුම් කර ඇත. ඒ අනුව වෘත්තීය පුහුණුවේ පළමු භාගයේ දී මූලික පුහුණුව ආයතනය තුල දී ලබාදේ. එම කාලය තුළ මසකට රු. 600ක දීමනාවක් ආධුනිකයාට ලබාදේ. පරිගණක සිසුන්ට මෙම ගෙවීම සිදු නො කෙරේ. පුහුණුවේ දෙවන භාගයේ දී වැඩිදුර පුහුණුව සඳහා රජයට අනුබද්ධ හෝ නොවන ප්‍රධාන කර්මාන්තශාලාවලට අනුයුක්ත කරනු ලැබේ.

පෙදරේරු කාර්මික ශිල්පී, වඩු කාර්මික ශිල්පී (ගෘහ භාණ්ඩ හා පැස්සුම් ශිල්පි වැනි කාර්මික ශිල්ප සඳහා දේශීය හා විදේශීය රැකියා අවස්ථාවන් අතිශයින් වැඩි වී ඇත. පැස්සුම් ශිල්පි පාඨමාලාවේ දී පහත සඳහන් නවීන පැස්සුම් ශිල්පි ක්‍රම ද පුහුණු කරනු ලැබේ. (MMS/GAS/TIG/MIG/MAG/ PLASMA)

4. *ආධුනිකත්ව ගිවිසුම*

තෝරා ගනු ලබන සෑම ආධුනිකයෙකු විසින්ම ආධුනිකයා සහ සේවායෝජකයා යන දෙදෙනා වෙත අන්‍යොන්‍ය වගකීම පැවරෙන විශේෂ ආධුනිකත්ව ගිවිසුමකට ඇතුළත් විය යුතුය. පාඨමාලාවෙහි මුල් මාස 06 ආධුනිකයාගේ පරිවාස කාලය ලෙස සැලකේ. සතුටුදායක ලෙස පරිවාස කාලය අවසන් කිරීමට අපොහොසත් වුවහොත් ආධුනිකයාගේ ආධුනිකත්වය අවලංගු කරනු ලැබේ. හදාරනු ලබන පාඨමාලාව අනුව නිපුණ කාර්මික (විශේෂ) හෝ NVQ සහතිකය පුහුණුවෙන් පසු ලබා ගත හැකිය.

5. *තෝරා ගැනීමේ ක්‍රමය*

5.1 සියළුම අයදුම්කරුවන් පැය 1ක් වූ ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයකට කැඳවනු ලැබේ. මේ සඳහා රු. 100ක මුදලක් අයකරනු ලබන අතර ඒ පිළිබඳ වැඩි විස්තර පසුව දැනුම් දෙනු ලැබේ.

මෙම ලිඛිත අභියෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයකට කැඳවා එහි දී ලබාගන්නා ලකුණු මත පාඨමාලාව තෝරා දෙනු ලැබේ. සියලුම පාඨමාලාවන් දේශීය/විදේශීය රැකියා අවස්ථා ඇති සම මට්ටමේ උසස් පාඨමාලාවන් බව විශේෂයෙන් සඳහන් කළ යුතු ය.

5.2 පාඨමාලා සඳහා බඳවාගනු ලබන සියලුම අයදුම්කරුවන් තමාගේ පුහුණු කාලය අනුව පහත සඳහන් පරිදි ආයතනයට මුදල් ගෙවිය යුතුය.

| *පාඨමාලා කාලය* | *මාස 06* රු. | *අවු.01* රු. | *අවු. 02* රු. | *අවු. 03* රු. | *පරිගණක අවුරුදු 01* රු. |
|---|---|---|---|---|---|
| පාඨමාලා ගාස්තුව | – | – | – | – | 3,000 |
| ගුරු දෙගුරු සංගමයට | 100 0 | 150 0 | 250 0 | 350 0 | 150 0 |
| රක්ෂණ අරමුදලට | 200 0 | 400 0 | 800 0 | 1,200 0 | 400 0 |
| පොත් සඳහා | 50 0 | 50 0 | 50 0 | 50 0 | 50 0 |
| එකතුව | 350 0 | 600 0 | 1,100 0 | 1,600 0 | 3,600 0 |

5.3 ඉහත සඳහන් සුදුසුකම් සපුරන අයදුම්කරුවන් පමණක් පාඨමාලාවට බඳවා ගනු ලැබේ.

6. *අයදුම්පත් එවිය යුතු ආකාරය*

6.1 ඔබේ නම හා ලිපිනය ලියූ මුද්දර කවරයක් මෙම ආයතනයට එවීමෙන් හෝ ආයතනයට පැමිණීමෙන් හෝ ඉල්ලුම්පතක් ඔබට ලබා ගත හැකිය. නැතිනම් දක්වා ඇති ආකෘතියට අනුව 11 1/2" x 8 1/4" (A4) ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කළ ඉල්ලුම් පතක් එවිය හැකිය. ඔබගේ ඉල්ලුම්පත සමග ලිපිනය සඳහන් මුද්දර ගැසූ දිග ලියුම් කවරයක් 2007 මැයි මස 18 වැනි දිනට හෝ ඊට පෙර පහත ලිපිනයට යොමුකළ යුතු ය.

අධ්‍යක්ෂ/විදුහල්පති,
ආධුනිකත්ව අභ්‍යාස ආයතනය,
අංක 581, ගාලුපාර, කටුබැද්ද, මොරටුව.

6.2 එක් අයදුම්කරුවෙකු තමන් කැමති පාඨමාලා තුනක නම් ඉල්ලුපතේ සඳහන් කළ යුතුය.

6.3 ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු කිරීම් අධිකාරිය යටතේ පූර්ණ කාලීන පාඨමාලාවක් හැදෑරූ අයට හෝ දැනට හදාරණ අයට මේ සඳහා අයදුම්කළ නොහැක.

6.4 අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස උඩ කෙළවරේ "ආධුනිකයන් බඳවා ගැනීම-2007 ජූලි" යන්න සඳහන් කළ යුතුය.

7. තැපැලේ දී නැතිවන හා ප්‍රමාදවන අයදුම්පත් සම්බන්ධයෙන් ආධුනික්ත්‍ව අභ්‍යාස ආයතනය වග කියනු නොලැබේ. ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා සම්පූර්ණ කරන ලද අයදුම්පත කල් ඇතිව ඉදිරිපත් කරන මෙන් දන්වා සිටිනු ලැබේ.

ආදර්ශ අයදුම් පත්‍රය (11 1/2" x8 1/4"( A 4) ප්‍රමාණයේ)

| |
|---|
| |

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි.

ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව

*ආධුනිකයන් බඳවා ගැනීම - 2007 ජූලි*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :————. මයා/මිය/මෙනවිය
2. මුලකුරු සමග නම :————.
3. ලිපිනය :————.
4. පදිංචිය :————.
   (i) ග්‍රාමසේවා වසම :————.
   (ii) ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :————.
   (iii) ඡන්ද කොට්ඨාසය :————.
   (iv) දිස්ත්‍රික්කය :————.
5. දුරකථන අංකය :————.
6. උපන් දිනය :————.
7. ජාතික හැඳුනුම්පත් අංකය :————.

8. ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් X ලකුණින් දක්වන්න :————.

අට වැනි ශ්‍රේණිය ☐ අ. පො. ස.(සා. පෙළ) ☐

*විභාග අංකය* :————. *වර්ෂය* :————.

| *විෂයයන්* | *සාමාර්ථය* | *වර්ෂය* |
|---|---|---|
| | | |

9. ඔබගේ සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා තුනක නම් සඳහන් කරන්න.

1. ————.
2. ————.
3. ————.

ඉහත සඳහන් විස්තර සත්‍ය බවට සහතික කරමි.

————.
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

සභාපති,
ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණුකිරීම් අධිකාරිය.

04-485

---

## ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය – මොරටුව

### ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම – 2007 වර්ෂය

පහත සඳහන් අවම සුදුසුකම් ඇති ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයෙන්ම 2007 වර්ෂය සඳහා ඇතුළත් කර ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

1. *(අ) වයස* : 2007.03.31 වැනි දිනට වයස අවුරුදු 16 ත් 22 ත් අතර විය යුතුය.

*(ආ) අධ්‍යාපන සුදුසුකම්.*– අ. පො. ස. (සා. පෙළ) විභාගයේ දී (අධ්‍යාපන මාධ්‍යය) අනුව සිංහල/දෙමළ භාෂාව සහ ගණිතය ඇතුළුව විෂයයන් 06 ක් එකවර සමත්වීම.

*(ඇ) සැ. යු.*.– පහත නම් සඳහන් පුහුණු ආයතනවල දැනට පූර්ණ කාලීන පාඨමාලා හදාරන ආධුනික/ආධුනිකාවන්ට මෙම පුහුණුව සඳහා ඉල්ලුම් කළ නොහැක.

(i) ආධුනිකත්ව අභ්‍යාස ආයතනය - මොරටුව,
(ii) මෝටර් රථ ඉංජිනේරු අභ්‍යාස ආයතනය, ඔරුගොඩවත්ත,
(iii) ලංකා ජර්මන් දුම්රිය අභ්‍යාස ආයතනය, රත්මලාන.

2. *ඇතුළත්වීමේ විභාගය* :

*පවත්වන මාධ්‍යය* .– සිංහල සහ දෙමළ භාෂා වලින්.

*පුහුණු කිරීමේ උපදෙස්.*–සියලුම පාඨමාලා සිංහල මාධ්‍යයෙන් පවත්වන අතර දැනට තිබෙන පහසුකම් අනුව මෝටර් කාර්මික ශිල්පය පමණක් දෙමළ භාෂාවෙන් ද පැවැත්වේ.

3. *විභාග මධ්‍යස්ථාන* : – පහත සඳහන් ආදර්ශ අයදුම්පත් පෝරමය අනුව අයදුම් කරන අය සඳහා ලිඛිත පරීක්ෂණයක් කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල සහ අනුරාධපුරය යන විභාග මධ්‍යස්ථානවල දී පැවැත්වේ. එහෙත් මීට අමතරව යම් පළාතක විභාග අයදුම්කරුවන් 100 කට වැඩි ප්‍රමාණයක් සිටී නම් එම පළාතේ විභාග මධ්‍යස්ථානයක් පැවැත්වීමට කටයුතු කරනු ඇත. අවශ්‍ය අවම සුදුසුකම් හා අංක 04 සඳහන් විභාග ගාස්තු එවා ඇති අයදුම්කරුවන් පමණක් ඇතුළත් කිරීමේ විභාගයට කැඳවනු ලැබේ.

*විභාගයට අදාළ විෂයයන්* :– ඇතුළත්වීමේ විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වන අතර ගණිතය, සාමාන්‍ය දැනීම, බුද්ධි පරීක්ෂණය සහ කාර්මික ඇඳීම යන විෂයයන් පදනම් කර සකස් කරනු ලැබේ.

4. *විභාග ගාස්තු* : විභාග ගාස්තු වශයෙන් රු. 250 ක් ගෙවිය යුතුය. එම මුදල ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගෙවිය හැක.

*ගෙවන ක්‍රමය.*- ගණකාධිකාරි, ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, ලංකා බැංකුව, මොරටුව ශාඛාව, ගිණුම් අංකය 681490 දරන ගිණුමට මුදල් බැර කළ යුතුය.

ඕනෑම ලංකා බැංකු ශාඛාවකින් ගිණුම් අංකය 681490 ට රු. 250 ගෙවා ලබාගත් රිසිට් පත අයදුම්පත්‍රයට අමුණා එවිය යුතුයි.

ඉහත මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සිය අමුණා නොඑවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. ඇතුළත්වීමේ විභාගයට පෙනී නොසිටීම නිසා හෝ වෙනත් කිසිම හේතුවක් නිසා හෝ විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන බව විශේෂයෙන් සැලකිය යුතුය.

5. *මූලික තෝරාගැනීම.*– ලිඛිත පරීක්ෂණයෙන් ඉහළම ලකුණු ලබා ගන්නා අයදුම්කරුවන් අතරින් ප්‍රමුඛතම පදනම මත සීමිත සංඛ්‍යාවක් අවසාන තෝරා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා සහ සම්මුඛ පරීක්ෂණයට අයදුම්කරුවන් කැඳවීමේ දී අඩු පහසුකම් සහිත පළාත් සඳහා ලැබිය යුතු ඉහළම ලකුණු මට්ටම පාලක මණ්ඩලය මගින් තීරණය කරනු ලැබේ. (අඩු පහසුකම් ඇති ප්‍රදේශ ලෙස ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව නිර්දේශ කරනු ලබන පළාත් පමණක් සලකනු ලැබේ.)

6. *අවසන් තෝරා ගැනීම* .– යෝග්‍යතා සම්මුඛ පරීක්ෂණයෙන් ලබා ගන්නා ලද ඉහළම ලකුණු ප්‍රමාණය මත බඳවා ගනු ලබන සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. යෝග්‍යතා පරීක්ෂණය සඳහා 40%ක් ද, සම්මුඛ පරීක්ෂණය සඳහා 60%ක් ද, ලබාගත හැක. බාහිර කුසලතා කෙරෙහි විශේෂ සැලකිල්ලට සම්මුඛ පරීක්ෂණයේ දී දක්වනු ලැබේ. අනතුරුව ආයතනයට බඳවා ගත හැකි සංඛ්‍යාව සීමිත බැවින් සමත්වන අයදුම්කරුවන් වෛද්‍ය පරීක්ෂණයට යටත්ව පුහුණුව සඳහා තෝරා ගනු ලබන අතර, වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත්වන අයදුම්කරුවන් පුහුණුවෙන් ඉවත් කරනු ලබන බව සැළකිය යුතුයි.

7. *පුහුණු පාඨමාලා* :

| | | |
|---|---|---|
| මෝටර් කාර්මික ශිල්පය | - | අවු. 03-04 |
| මිල්රයිට් වැඩ්දුම් ශිල්පය | - | අවු. 03-04 |
| වායු සමීකරණ/ශීතකරණ ශිල්පය | - | අවු. 03 1/2 |
| බල විදුලි ශිල්පය | - | අවු. 03 1/2 |
| යාන්ත්‍රික ශිල්පය | - | අවු. 03 1/2 |
| ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පය | - | අවු. 03 |
| වාහන විදුලි ශිල්පය | - | අවු. 03 |
| පෑස්සුම් ශිල්පය | - | අවු. 03 |

මෙම පුහුණු පාඨමාලා හැදෑරීමට අවස්ථාව ලබා දෙනුයේ ප්‍රථම වසරේ දී මූලික පුහුණු කාලයට මාස 06 කින් පසුව වෘත්තීය තෝරා ගැනීමේ පරීක්ෂණයේ දී ලබන කුසලතා ප්‍රතිඵල අනුවය.

8. *ගිවිසුම් අත්සන් කිරීම* :– ආයතනයේ පුහුණුවට තෝරා ගනු ලබන සියලුම අයදුම්කරුවන්ට ලැබෙන ඒ ඒ වෘත්තීන්ට අදාළව අවුරුදු 04, 03 1/2 සහ 03 ක් වූ පාඨමාලා සාර්ථක ව හදාරන බවට මෙම ආයතනය සහ ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු කිරීම් අධිකාරිය සමග ගිවිසුම්වලට අත්සන් තැබිය යුතුය.

9. *අයදුම්පත්* :– පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත් පෝරමයට අනුව තම අයදුම්පත්‍රය පිළියෙල කොට අධ්‍යාපන සහතිකයේ පිටපතක් ද, අමුණා, ගල්කිස්ස, ගාලු පාරේ, අංක 582 හි ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනයේ, පිරිස් කළමණාකාර වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස උඩ කෙළවරේ "ලං. ජ. කා. අ. ආ/62/ 2007" යනුවෙන් සඳහන් කළ යුතු අතර සෑම අයදුම්පතක්ම මි. මී. 210 x 297 (ඒ4) ප්‍රමාණයේ කඩදාසියක සකස් කර ගත යුතුයි.

10. *අයදුම්පත් භාර ගන්නා අවසාන දිනය* :- අයදුම්පත් 2007.05.25 වන දිනට හෝ ඊට ප්‍රථම ලැබෙන සේ එවිය යුතුයි. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

පිරිස් කළමනාකාර,
ලං.ජ.කා.අ.ආ.

ලංකා ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය,
අංක 582, ගාලු පාර, ගල්කිස්ස.
(අඟුලාන හංදිය අසල),
දුරකථන අංක : 605625.

ආදර්ශ අයදුම් පත්‍රය

ලංකා - ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය - මොරටුව

*ජාතික ආධුනිකත්ව ක්‍රමය යටතේ පූර්ණ කාලීන පාඨමාලා සඳහා ඇතුළත් කර ගැනීම - 2007*

01. *(අ)* සම්පූර්ණ නම (සිංහලෙන්) :——————.
(ඉංග්‍රීසියෙන්) :——————.
*(ආ)* මුලකුරු සමග නම :——————.

02. *(අ)* තැපැල් ලිපිනය :——————.
*(ආ)* දිස්ත්‍රික්කය :——————.
*(ඇ)* පළාත :——————.

03. *(අ)* උපන් දිනය :——————.
*(ආ)* 2007.03.31 වැනි දිනට වයස :
අවු :——————. මාස :——————. දින :——————.

04. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

05. අධ්‍යාපන සුදුසුකම් :
අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයන් :

*විභාග අංකය* :——————, *වර්ෂය* :——————,

| | *විෂයයන්* | *සාමාර්ථය* | | *විෂයයන්* | *සාමාර්ථය* |
|---|---|---|---|---|---|
| 1. | ————. | ————. | 5 | ————. | ————. |
| 2. | ————. | ————. | 6 | ————. | ————. |
| 3. | ————. | ————. | 7. | ————. | ————. |
| 4. | ————. | ————. | 8. | ————. | ————. |

06. ජාතික හෝ තැපැල් හැඳුනුම්පත් අංකය :————.

07. *(අ)* අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති මාධ්‍යය :————.
*(ආ)* අයදුම්කරු විභාගයට පෙනී සිටීමට කැමති විභාග මධ්‍යස්ථානය :————.
(කොළඹ, මහනුවර, ගාල්ල, බදුල්ල, අනුරාධපුර හෝ පළාත්)

08. (i) මුදල් ගෙවූ ලංකා බැංකු ශාඛාවේ නම :——————.
(ii) මුදල් ගෙවූ දිනය :——————.

09. ඉහත සඳහන් කර ඇති විස්තර සත්‍ය බවත්, නිවැරදි බවත් මෙයින් සහතික කරමි. මෙහි සඳහන් විස්තර වලින් යමක් අසත්‍ය බව හෝ සාවද්‍ය බව මා තෝරා ගැනීමෙන් පසු පෙනී ගියහොත් පුහුණුවෙන් ඉවත් කර දමනු ලැබීමට හැකි වන බව දනිමි.

————,
අයදුම්කරුගේ/කාරියගේ අත්සන.

දිනය :——————.

04-462